# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

**අංක 2190/25 - 2020 අගෝස්තු මස 25 වැනි අඟහරුවාදා - 2020.08.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) උප වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ මුදල් වැය කරමින් සිදු කරන සංවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් මුදල් වර්ෂයට අදාළ සංවර්ධන සැළසුම් සකස් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී අදාළ කරගත යුතු රීති මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී(ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2020 ක් වූ අගෝස්තු මස 24 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ සංවර්ධන සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ රීති**

1. මෙම රීති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළව යම් මුදල් වර්ෂයක් වෙනුවෙන් සංවර්ධන සැළසුම් සකස් කිරීම හා එම සැළසුම් ක්‍රියාත්මක කිරීමට අදාළවන නිර්ණායක නියම කිරීම සඳහා පනවනු ලැබේ.
2. මෙම රීති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ සංවර්ධන සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ රීති ලෙස හැඳින්වේ.
3. බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළව මුදල් වර්ෂයක් වෙනුවෙන් වාර්ෂික සංවර්ධන සැළැස්ම හා ක්‍රියාත්මක සැළැස්ම සකස් කිරීමේ දී බස්නාහිර පළාතේ එක් එක් පළාත් අමාත්‍යාංශය විසින් පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූල වෙමින් ක්‍රියාකළ යුතු බවට මෙයින් නියම කරමි.

(1) බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ වාර්ෂික සංවර්ධන සැළසුම් සකස් කිරීමේ දී ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව බස්නාහිර පළාත සඳහා සංවර්ධන යෝජනා සැළකිල්ලට ගත යුතුය.

(2) මධ්‍යකාලීන ආංශික ප්‍රතිඵල රාමුව තුළ දැනටමත් හඳුනාගෙන ඇති ප්‍රමුඛ පරාස, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාක්ෂාත් වන අයුරින් සංවර්ධන සැලැස්ම සකස් කළ යුතුය.

(3) සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී එම ව්‍යාපෘති ද්විකරණය වීම වළක්වාලීමට අමාත්‍යාංශ විෂය පථයට සෘජුවම අයත් වන ව්‍යාපෘති සඳහා සැලසුම් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. මෙහිදි ව්‍යාපෘති බලධාරිත්වය හා ක්‍රියාත්මක බලධාරිත්වය අදාළ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනය වෙත ලබා දීමට ප්‍රමුඛතාවය දිය යුතුය.

(4) සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී සියලු ව්‍යාපෘති අදාළ ව්‍යාපෘති බලධාරිත්වයේ අධීක්ෂණයට ලක් විය යුතුය.

(5) ව්‍යාපෘතිවල තිරසාර බව හා ඵලදායී බව රැකගැනීම සඳහා කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

(6) පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුවක් සහිත විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් සකස් කර, ව්‍යාපෘති බලධාරියා මඟින් අනුමත කරවා ගත යුතුය. රුපියල් මිලියන පහ දක්වා ඉහත පරිදි කටයුතු කළ යුතු අතර, ඊට වැඩි වටිනාකම් ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් කලින් කල නිකුත් කරනු ලබන චක්‍රලේඛන උපදෙස්වලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(7) (i) වර්ෂ කිහිපයක් ගතවන නව ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් කරන විට ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුව දළ වශයෙන් හා එක් එක් වර්ෂයේ නිමකිරීමට අපේක්ෂිත ප්‍රමාණයන් ඉදිරිපත් කළ යුතුය. එසේම ඉදිරි වර්ෂවලදී ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයාගන්නා ආකාරය දැක්විය යුතුය.

(ii) එසේම වසරක් තුළ නිමකිරීමට අපේක්ෂාකරන ව්‍යාපෘතිවල අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය සපයාගන්නා ආකාරය පිළිබඳව මනා සැලසුමකින් තොරව ව්‍යාපෘති ආරම්භ කිරීම නොකළ යුතුය.

(8) දේපළක් පුනරුත්තාපනය කිරීමට හෝ ඉදිකිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේදී රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයකට අයත් විය යුතුය. එසේම ගොඩනැගිලි ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට පෙර එම දේපළ අනාගතයේදී නිරවුල්ව ප්‍රයෝජනයට ගතහැකි බවට සෑහීමකට පත්විය යුතු අතරම, එම ඉදිකිරීම අනාගතයේදී නඩත්තු කරන ආකාරය පිළිබඳව පැහැදිලි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුය.

(9) අදාළ අංශ සඳහා දක්වා ඇති කාර්යයන්ට අතිරේකව කාලීන අවශ්‍යතා හා විශේෂ අවස්ථා සම්බන්ධයෙන් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් වීමේදී, අදාළ පළාත් අමාත්‍යාංශ ලේකම් වෙතින් හෝ ක්‍රියාත්මක බලධාරියා වෙතින් නිර්දේශයක් සහිතව සාධාරණීකරණ වාර්තාවක් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් සෑහීමකට පත්වන අවස්ථාවලදී එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ලේකම් අනුමැතිය ලබා දිය යුතුය.

(10) පළාත් සේවාවන් සිදුවන රජයේ ලියාපදිංචි පොදු ගොඩනැගිලි සංවර්ධනය හා ඉදිකිරීම සඳහා ක්‍රියාත්මක බලධාරීත්වයේ සාධාරණීකරණය මත හා නිර්දේශය මත ප්‍රතිපාදන වෙන් කළ හැකිය.

(11) පළාත් සංවර්ධන වැඩසටහන යටතේ වෙන්කරනු ලබන ප්‍රතිපාදන මඟින් නිළධාරීන් පුහුණු කිරීම සිදු නොකළයුතු අතර, ඒවා ප්‍රාග්ධන වියදම් සඳහාම යොමුකළ යුතුය.

4. අධ්‍යාපන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) වෙනත් අරමුදල් ප්‍රභවයන් යොදවා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සමග ද්විගණනය නොවන පරිදි රජයේ පාසල්වල ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධන කටයුතු, ආරක්ෂිත වැට හා ගේට්ටු ඉදිකිරීම, සනීපාරක්ෂක කටයුතු සහ පානීය ජලය ලබා දීම, ක්‍රීඩා භූමි, ළමා උද්‍යාන ඉදිකිරීම හා සංවර්ධනය ඇතුළු පාසල්වල අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය මත පාසල් සංවර්ධනය සඳහා සෘජුව දායකවන පරිගණක, ඩෙස්, පුටු, තූර්ය වාදන භාණ්ඩ, ක්‍රීඩා උපකරණ හා විද්‍යාගාර උපකරණ වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබා දීම සිදු කළ හැකිය.

(2) පවුලේ ආදායම් මට්ටම අඩු වීම නිසා පොත්පත් අධ්‍යාපනික උපකරණ මිලදී ගැනීමට අපොහොසත් සිසුන් සඳහා එක් සිසුවෙකුට වසරකට රුපියල් පන් දහසක උපරිමයකට යටත්ව අධ්‍යාපනික උපකරණවන පොත්පත්, පෑන් පැන්සල්, කවකටු පෙට්ටි හා පොත් බෑග් වැනි දෑ ලබාදිය හැකිය. පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳව ග්‍රාම නිලධාරි හා විදුහල්පතිගේ නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව අදාළ පන්තිභාර ගුරුවරයා මාර්ගයෙන් අදාළ සිසුවාට එම පරිත්‍යාගය සිදු කළ යුතුවේ. ඉහත කාර්යයන්හි දී දෙපාර්තමේන්තු ප්‍රධානියා, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් තහවුරුවක් ලබාගත යුතුය. එසේම ඒ සම්බන්ධයෙන් පාසලේ අනෙකුත් සිසුන් දැනුවත් නොකළ යුතු අතර, මෙම අරමුදල් භාවිතයට ගෙන සිසුන්ට පොදුවේ පොත් පත් හා උපකරණ ලබාදීම සිදු නොකළ යුතුය.

(3) පළාත් සභා පාසැල් වල සිසුන්, ගුරුවරුන් හා විදුහල්පතිවරුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනයට විෂය සමගාමී සම්මන්ත්‍රණ, පුහුණු වැඩමුළු පැවැත්වීමට කටයුතු කිරීම, තෝරාගනු ලබන සම්පත්දායකයින් එම විෂය සඳහා ප්‍රවීණයන් බවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තහවුරු කළ යුතුය.

(4) විභාග ඉලක්ක කර පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ පැවැත්වීමේදී වැඩසටහනින් අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට හැකිවන පරිදි නියමිත කාලවකවානු තුළ අදාළ වැඩසටහන සැලසුම් කළ යුතුය.

(5) ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති පහත ආකාරයට විය යුතුය.

(i) ළමුන් සඳහා ශිෂ්‍යත්ව උපහාර වැඩසටහන් පැවැත්වීම.

(ii) පාසැල් අධ්‍යාපනය අතහැරයන දරුවන්ගේ කුසලතාවන්ට අනුකූල වෘත්තීමය අධ්‍යාපනයට යොමුකළ හැකි විශේෂ වැඩසටහන් සැලසුම් කිරීමේදී ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූල යෝජනා ඉදිරිපත් කිරීම.

(iii) විශේෂ අධ්‍යාපන හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සඳහා අවශ්‍ය වන අත්‍යවශ්‍ය උපකරණ ලබා දීම.

(iv) රජයේ, පළාත් සභා, පළාත් පාලන ආයතන යටතේවන පෙර පාසල්වල ගොඩනැගිලි සංවර්ධනය කිරීම කළ හැකිය.

(v) රුපියල් එක් ලක්ෂ පනස් දහසක උපරිමයකට යටත්ව පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(vi) පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලියාපදිංචි පෙර පාසල් සඳහා ඩෙස්ක්, පුටු හා අනෙකුත් අත්‍යවශ්‍ය උපකරණ රුපියල් පනස් දහසක උපරිමයක් යටතේ ලබා දීම.

5. ඉඩම් විෂය යටතේ යෝජනා හඳුනා ගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ හැක.

(1) පාරිසරික සංරක්ෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ඉඩම් පුනරුත්ථාපනය හා සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(2) ඉඩම් වලට අදාළ නීතිරීති ක්‍රියාවට නැංවීම, රජයේ ඉඩම් පෞද්ගලික හෝ ආයතනික මට්ටමින් පැවරීම හා ඉඩම් දත්ත පවත්වා ගැනීම වැනි කාර්යයන්ට අදාළ ප්‍රාග්ධන ස්වරූපයේ ආයෝජන සඳහා සැලසුම් කරමින් යෝජනා ඉදිරිපත් කිරීම.

(3) ජනපදලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා පොදු යටිතල පහසුකම් සංවර්ධනය සහ ඉදිකිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

6. පළාත් පාලන හා පළාත් පරිපාලන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ හැක.

(1) පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි පිහිටි පොදු ග්‍රාමීය මාර්ග සංවර්ධනය හා නඩත්තුව හා අදාළ ග්‍රාමීය මාර්ගවල පිහිටි කුඩා පාලම්, බෝක්කු වැනි අනෙකුත් සංවර්ධන කටයුතු.

(2) ප්‍රජාශාලා, සතිපොළ, පානීය ජල සැපයුම්, පුස්තකාල සේවා, ආදාහනාගාර, සුසාන භූමි නියමානුකූල කිරීම හා සංවර්ධනය, මාතෘ සායන, පෙරපාසල්, ක්‍රීඩාපිටි හා උද්‍යාන වැනි පළාත් පාලන සේවා සංවර්ධනය හා නඩත්තුව.

(3) පළාත් පාලන බලප්‍රදේශය තුළ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව මනාව පවත්වා ගෙන යාම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය, පොදු වැසිකිළි, කාණු පද්ධති හා ඇල මාර්ග, සංවර්ධනය හා නඩත්තුව.

(4) පළාත් පාලන ආයතන පද්ධතිය කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීම.

(5) රජයේ හා පළාත් පාලන ආයතන ඉඩම්වල පිහිටි ප්‍රජා ශාලා, පොදු ගොඩනැගිලි සඳහා ජල පහසුකම් හා විදුලිය පහසුකම් ලබා දීම.

(6) පළාත් පාලන ආයතන සේවා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට හා දිශාගත කිරීමට නිලධාරීන් හා ප්‍රජාව බලගැන්වීමේ කටයුතු.

(7) පළාත් පාලන සේවා සැපයීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සැපයීම හා නඩත්තු ඒකක පවත්වාගෙන යාම.

(8) කසළ කළමනාකරණයට අවශ්‍ය කසළ වෙන් කිරීමේ බඳුන් හා කොම්පෝස්ට් බඳුන් ලබා දීම.

(9) පළාත් පාලන ආයතන වලට ඉටුකරගත නොහැකි මහා පරිමාණ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම.

(10) ආපදා කළමනාකරණය සඳහා අවශ්‍ය පහසුකම් සහ උපකරණ ලබාදීම.

(11) ප්‍රාදේශීය සභාවේ විධිමත් ලෙස ලියාපදිංචි වසර දෙකකට වඩා සක්‍රීයව පවත්වාගෙන යනු ලබන හා දැනට පුටු හා එකලස් කළ හැකි ආවරණ ප්‍රමාණවත්ව නොමැති ප්‍රජා මණ්ඩල සඳහා රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව එම උපකරණ ලබා දීම.

7. කෘෂිකර්ම විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ හැක.

(1) පළාතේ කෘෂි බෝගවල නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ලියාපදිංචි ගොවි සංවිධානවලට ප්‍රතිලාභී දායකත්වය මුළු වටිනාකමින් 30% ක් වන සේ උපරිමය රුපියල් ලක්ෂයක් දක්වා කෘෂි උපකරණ ලබාදීම.

(2) පළාතේ කෘෂි බෝගවල නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ගොවීන් වෙත බීජ,රෝපණ ද්‍රව්‍ය හා යෙදවුම් ප්‍රතිලාභී දායකත්වය මුළු වටිනාකමින් 30% ක් වන සේ රුපියල් පනස් දහසක උපරිමයකට යටත්ව ලබාදීම.

(3) නිෂ්පාදිත කෘෂි භෝග අලෙවි ප්‍රවර්ධනයට අදාළ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(4) වස විසෙන් තොර ගුණාත්මක එළවළු පළතුරු භාවිතය ගෘහස්ථ මට්ටමෙන් සුලභ කිරීම සඳහා කාබනික පොහොර භාවිතය වැඩිකිරීමට අදාළ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(5) අගය එකතුකළ නිෂ්පාදන හා ඒවාට වෙළඳපොල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(6) ගොවීන්, ගොවි සංවිධාන සහ ව්‍යාප්ති සේවාවන්ට අදාළ නිලධාරී පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(7) පාසල්, නිවාස හා රජයේ ආයතන ආශ්‍රිතව ආදර්ශන ලෙස ගෙවතු වගාවන් ප්‍රවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා අවශ්‍ය අවස්ථාවලදී යෙදවුම් ලබාදීම.

(8) ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සහ යෙදවුම් සුලභතාවය ඇති කිරීම තුළින් පළාතේ බෝග නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා කටයුතු සිදු කිරීම.

(9) කෘෂි ව්‍යාපාර හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයට හා පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(10) තරුණ ප්‍රජාව කෘෂිකර්මයට නැඹුරු කරවීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(11) පරිසර හිතකාමී කෘෂිකාර්මික යෝජනා ඉදිරිපත් කිරීම.

(12) වගාවට නොගත් ඉඩම් ඵලදායී අයුරින් වගා කටයුතු සඳහා යෙදවීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(13) දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තුදෙන ආකාරයට වැඩිදියුණු කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය ගොවීන් අතර ප්‍රචලිත කිරීම.

(14) පරිසරයට අවම බලපෑම් වන අයුරින් වගාකටයුතු සිදුකළයුතු ආකාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.

(15) නව කෘෂිකාර්මික දැනුම ගොවීන් වෙත සම්ප්‍රේෂණය කිරීම.

(16) කෘෂිකර්මාන්තයට අයත් ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධන කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

8. සුළු වාරිමාර්ග විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) කෘෂිකාර්මික කටයුතු කරනු ලබන ගොවිබිම් සඳහා ජල සැපයුම ලබාදීමේ දී ගොවිබිම් දක්වා ජලය ගෙනයාමට අවශ්‍ය පහසුකම් සැපයීම.

(2) පවතින හා නව වාරිමාර්ග ක්‍රම නඩත්තු කිරීම,සංවර්ධනය කිරීම හා නව වාරිමාර්ග, උපරිම ශ්‍රම දායකත්වය ලබාගත හැකි පරිදි ඉදි කිරීම.

(3) ජල කළමනාකරණය පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීමට වැඩසටහන් පැවැත්වීම.

(4) සුළු වාරිමාර්ගවලට අයත් ඉදිකිරීම් හෝ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත වාරිමාර්ග හෝ වෙනත් අංග සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(5) කෘෂිකාර්මික බිම් සඳහා ප්‍රවේශ වීමට කෘෂිමාර්ග හා ට්‍රැක්ටර් පැන්නුම් ඉදිකිරීම.

(9) කර්මාන්ත විෂය යටතේ යෝජනා හඳුනා ගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) විවිධ පරාසයන් ආවරණය වන පරිදි දේශීය සම්ප්‍රදායික කර්මාන්ත දිරිගැන්වීම හා එම නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හැකිවන පරිදි ලියාපදිංචි කරන ලද ක්‍රියාකාරී කුඩා කර්මාන්ත සමිතියක, නිශ්චිතව හඳුනාගත් ව්‍යාපෘති සඳහා, අවශ්‍ය යෙදවුම්, උපකරණ මිලදී ගැනීම සඳහා ආධාර ලබාදිය හැකිය. එහිදී වටිනාකමින් 30% ක දායකත්වයක් අදාළ සමිතිය මගින් දැරිය යුතු අතර, ලබාදිය හැකි උපරිම ආධාර වටිනාකම රුපියල් ලක්ෂ දෙකකි. මේ සඳහා ව්‍යාපෘති වාර්තාව සමග අදාළ කර්මාන්ත ප්‍රවර්ධන නිලධාරියාගේ නිර්දේශය අනිවාර්ය වේ. මීට අමතරව දේශීය සම්ප්‍රදායික කර්මාන්තයෙහි යෙදෙන එක් ප්‍රතිලාභියෙකු සඳහා උපකරණ ලබා දෙන්නේනම් 30%ක ප්‍රතිලාභී දායකත්වය මත රුපියල් පනස් දහසක උපරිමයකට යටත්ව ලබාදිය යුතුය.

(2) එම සංවිධානවල නිෂ්පාදන අලෙවියට වෙළෙඳපොළ හඳුන්වාදීමත්, ජංගම වෙළෙඳපොළවල් සහ ප්‍රදර්ශන පැවැත්වීම සඳහාත් දායකවීම.

(3) නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීමට යෝජනා ඉදිරිපත් කිරීම.

(4) කර්මාන්තවල නියැලෙන අයගේ හැකියාවන් ප්‍රවර්ධනයට පුහුණු වැඩසටහන් පැවැත්වීමේදී ඉලක්කගත කණ්ඩායම අනුව සම්පත් දායකත්වය තෝරාගත යුතුය. එම සම්පත් දායකයා විෂය ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය නිපුණත්වයකින් යුතු ප්‍රවීණයකු විය යුතුය. එසේම පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික ඉදිරිපත් කළ යුතු අතර, ව්‍යාපෘතියේ ස්වභාවය පරිදි ව්‍යාපෘති හෝ ක්‍රියාත්මක බලධාරියාගේ පූර්ණ අනුමැතිය ලබාගත යුතුය.

(5) ස්වයං රැකියාවක නිරත හෝ නිරතවීමට අපේක්ෂිත පුද්ගලයින්ගේ පුහුණු පාඨමාලාවන් සඳහා එක් පුද්ගලයෙකුට රුපියල් විසිපන්දහසක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන ලබාදිය හැකි අතර, වෙනත් ක්‍රමයකින් ආවරණය නොවූ හා මීට පෙර එවැනි අනුග්‍රාහක දීමනාවක් ලබා නොමැති අය හා පහත පුද්ගල කාණ්ඩවලට ඇතුළත් අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛත්වයක් ලබා දිය යුතුය.

(i) අඩු ආදායම්ලාභී පවුල්වල අවු.18-45 ත් අතර සිටින පුද්ගලයින්

(ii) වැන්දඹුවන්

(iii) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්

(6) පළාත් සංවර්ධන මූල්‍ය මූලාශ්‍රය යටතේ ස්වයං රැකියා උපකරණ ලෙස ඍජු ප්‍රදාන ලබා දීමේදී ප්‍රතිලාභී දායකත්වයකින් තොරව රුපියල් පනස් දහසක උපරිමයකට යටත්ව ස්වයං රැකියා උපකරණ ලබා දීම. රුපියල් පනස් දහසක් ඉක්මවන අවස්ථාවලදී එම ඉක්මවන මුදල ප්‍රතිලාභියා විසින් දැරිය යුතු වේ. මෙහිදී අදාළ ප්‍රතිලාභියා අඩු ආදායම්ලාභියෙකු ලෙස තහවුරු විය යුතුය.

එසේම, එම ඍජු ප්‍රදාන ලබන ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය අනුමැතියට ඉදිරිපත් කළ යුතු අතර, බස්නාහිර පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දිරිගැන්වීම සඳහා කටයුතු කිරීම, ඔවුන්ට ව්‍යවසායකත්ව පුහුණුව හා ශිල්පීය පුහුණුව ලබා දීම, මූල්‍ය සේවාවන් හා මූල්‍ය ණය පහසුකම් ලබා දීම, ඔවුන් සඳහා විශ්‍රාම වැටුපක් සකස් කිරීම හා අලෙවිකරුවන්ගේ තොරතුරු ජාලගත කිරීමේ වැඩසටහන් හා පළාතේ නව නිපැයුම්කරුවන් ඒකරාශී කර ඔවුනට වැඩසටහන් පවත්වා ඔවුන් මධ්‍යම රජයේ ආයතන හා සම්බන්ධ කර ජාතික සංවර්ධනයට දායක කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර,ඒ යටතේ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ පමණක් ලබා දිය යුතුවේ. පාරිභෝගික භාණ්ඩ ලබා නොදිය යුතුය.

(10) පාරිසරික කටයුතු විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) බස්නාහිර පළාතේ දැනට පවතින පරිසර පද්ධතිය තිරසාරව පවත්වාගෙන යාම.

(2) පළාත්වාසී ප්‍රජාව සඳහා නාගරික තුරුගොමු, වන උයන්, ඔසු උයන් ඇතුළු පාරිසරික උද්‍යාන ඇති කිරීම.

(3) මාර්ග දෙපස හරිත තීරු ඇති කිරීම.

(4) රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතන සම්බන්ධ කරගෙන පරිසර සංවර්ධනය සඳහා හවුල් ක්‍රියාකාරීත්වයක් ඇති කිරීම, හරිත ගම්මාන සහ ඔසු ගම්මාන ඇති කිරීම.

(5) ජල මූලාශ්‍ර, ඇළ හා දොළ මාර්ග, වැව් හා පොකුණු, වෙරළ තීර හා කලපු යනාදී ජලජ පරිසර පද්ධති ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම.

(6) බස්නාහිර පළාතේ ප්‍රබල පාරිසරික ගැටලු හඳුනාගෙන විසඳීම සඳහා පාර්ශවකාර ආයතන/පුද්ගලයන් සමග සම්බන්ධීකරණයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(7) පාරිසරික දිනය සැමරීම.

(8) ජාතික මට්ටමේ පරිසර වැඩසටහන් හා සම්බන්ධිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(9) වඳවී යාමට හා තර්ජනයට ලක්වූ ශාක හා සත්ත්ව විශේෂ සංරක්ෂණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

11. සංස්කෘතික හා කලා කටයුතු විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ හැක.

(1) පළාත තුළ පවත්නා සංස්කෘතික දායාදයන් හා උරුමයන් සුරකිමින් අනාගත පරපුරට දායාද කිරීමට උපකාරී වන ව්‍යාපෘති යෝජනා හඳුන්වා දීම.

(2) අඩු පහසුකම් පවතින ලියාපදිංචි ආගමික සිද්ධස්ථානවල හා දහම් පාසල්වල අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ පහක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන ලබාදිය හැකිය. එහිදී මීට පෙර ප්‍රතිපාදන නොලැබුණු ආගමික සිද්ධස්ථාන හා දහම් පාසල් සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.

(3) අඩු පහසුකම් පවතින ලියාපදිංචි දහම් පාසල් සඳහා දහම් පාසල් කටයුතු පවත්වාගෙන යෑම සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ලබාදිය හැකි අතර, පළාත් සංස්කෘතික නිළධාරිගේ නිර්දේශය මත එක් දහම් පාසලක් සඳහා වසර තුනකට වරක් වෙන් කළ හැකි උපරිමය රුපියල් ලක්ෂ දෙකකි.

(4) පාරම්පරික නැටුම් හා වෙනත් කලා කටයුතු සංරක්ෂණය හා ප්‍රවර්ධනයවන උත්සවයකට හෝ එක් පාරම්පරික නැටුම් කණ්ඩායමකට අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට උපරිම රුපියල් ලක්ෂ දෙකක ප්‍රතිපාදන වෙන් කළ හැකිය. උපරිම ප්‍රතිපාදන සීමාව ඉක්මවා ප්‍රතිපාදන සැළසිය යුතු අවස්ථාවලදී පළාත් සැලසුම් කමිටුව මඟින් අනුමැතිය ලබා ගෙන අදාළ ප්‍රතිපාදන වෙන් කිරීම.

(5) රජයේ ලියාපදිංචි කලායතන සඳහා අදාළ සංගීත භාණ්ඩ ලබා දීමට ප්‍රතිලාභී දායකත්වය 20% ක් යටතේ උපරිමය රුපියල් ලක්ෂයක් දක්වා පළාත් සංස්කෘතික නිළධාරිගේ නිර්දේශය මත ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කිරීම.

(6) පළාත් සභාව සතු සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනයට හා ඒවායේ කටයුතු ප්‍රවර්ධනය සඳහා උපකාරී වන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම.

(7) විවිධ සංස්කෘතික හා කලා ක්ෂේත්‍රයන්හි සුවිශේෂී හැකියාවන් දැක්වූ පුද්ගලයින් ඇගයීම සඳහා හා ප්‍රාදේශීය මට්ටමින් උපරිමය රුපියල් ලක්ෂ හතරක් වෙන් කිරීමටත්, උපරිම සීමාව ඉක්මවන පළාත් හෝ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විෂයය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ මත ප්‍රධාන ලේකම් සෑහීමකට පත්වන අවස්ථාවලදී එම යෝජනා ප්‍රධාන ලේකම් අනුමත කළ යුතුය.

(8) ප්‍රජාවගේ රසවින්දනය හා කලා හැකියාවන් වර්ධනය සඳහා ප්‍රාදේශීය වශයෙන් උපරිම රුපියල් ලක්ෂ දෙකක ප්‍රතිපාදන වෙන් කරමින් වැඩසටහන් සැලසුම් කිරීම. එසේ වුව ද,විෂයභාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ මත ප්‍රධාන ලේකම් සෑහීමකට පත්වන අවස්ථාවන්හිදී උපරිම ප්‍රතිපාදන සීමාව ඉක්මවා රුපියල් ලක්ෂ පහක් දක්වා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ප්‍රතිපාදන වෙන් කළ හැකිය.

(9) පාරම්පරික නැටුම් හා වෙනත් කලා කටයුතු සංරක්ෂණය හා ප්‍රවර්ධනය සහ ආගමික, සංස්කෘතික, කලා කටයුතු යටතේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද පෙරහැරවල් හෝ ඓතිහාසික වශයෙන් කාලාන්තරයක් තිස්සේ පවත්වාගෙන ආ පෙරහැරවල් පැවැත්වීම සඳහා අනුග්‍රාහක මුදලක් ලබා දිය හැකිය. මෙවා තෝරා ගැනීමේදී පළාත් සංස්කෘතික නිලධාරීන්ගේ නිර්දේශය ලබා ගත යුතු අතර, මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සංස්කෘතික අමාත්‍යාංශය යටතේ හෝ සුදුසු බලධාරීත්වයක් යටතේ ක්‍රියාත්මක කළ යුතුය.

(10) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සංවිධානය කරන, කොට්ඨාස මට්ටමින් හා දිස්ත්‍රික්ක මට්ටමින් පැවැත්වෙන වාර්ෂික සාහිත්‍ය උත්සව හා ඒ සඳහා වන අනුෂාංගික කරුණු වෙනුවෙන් උපරිමය රුපියල් ලක්ෂයක් දක්වා ප්‍රතිපාදන වෙන්කළ හැකිය.

12. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය යටතේ යෝජනා හඳුනා ගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, මධ්‍යම බෙහෙත් ශාලා, ඖෂධ ගබඩා, නිල නිවාස, සායනික ගොඩනැගිලි, අභ්‍යන්තර පිවිසුම් මාර්ග, අපවහන පද්ධති හා වෙනත් සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(2) රජයේ සෞඛ්‍ය ආයතනවල මහජන සෞඛ්‍ය සේවාවන් මනා ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය වන උපකරණ හා යන්ත්‍ර සූත්‍ර ලබාදීම.

(3) රෝග නිවාරණ හා ප්‍රතිකාර සේවා ශක්තිමත් කිරීමට සහ ගුණාත්මකභාවය වැඩි කිරීමට අවශ්‍ය පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් හා ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,ගර්භනී කාන්තාවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම හා සනීපාරක්ෂාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් පැවැත්වීම.

(4) රෝග නිවාරණ හා ප්‍රතිකාර සේවා ශක්තිමත් කිරීමට අවශ්‍ය තාක්ෂණය හඳුන්වා දීම.

(5) පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය හා සංවර්ධනය කිරීම.

(6) ඔසු උයන් සහ ඖෂධ නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.

(7) අඩු ආදායම්ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා එක් ප්‍රතිලාභී පවුලකට උපරිමය රුපියල් පනස් දහසක් වන පරිදි හා ප්‍රතිලාභී දායකත්වය ඉන් 25% ක් වන සේ ද්‍රව්‍යාධාර ලබා දීම.

13. පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) පරිවාස භාරයේ සිටින ළමුන්ගේ දෛනික අවශ්‍යතා හා සුබසාධනය තහවුරු කිරීම.

(2) පරිවාස ළමුන් සමාජගත කිරීමේ දී ළමුන්ට අවශ්‍ය දැනුම හා හැකියා වර්ධනයට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(3) ළමුන් පරිවාසගත වීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(4) පරිවාස දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහ ලියාපදිංචි ළමා නිවාස ඉදිකිරීම් හෝ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම.

(5) අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක්වූ දරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය සැලසීමට දැනුවත් වියයුතු කාර්ය මණ්ඩලවල ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

14. විදුලිබල හා බලශක්ති විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) විදුලි රැහැන් පද්ධතිය දීර්ඝ කිරීම, එකලා විදුලිය තෙකලා කිරීම, විදුලි උප පොලවල් ස්ථාපිත කිරීම හා විදුලි කණු විතැන් කිරීම.

(2) අඩු ආදායම්ලාභී, පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සිටින, විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සිටින නිවාස සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත ජාතික විදුලිබල පද්ධතියේ විදුලි සම්බන්ධතාව ලබා දීමට උපරිමය රුපියල් විසි පන් දහසක් ලබා දීම.

(3) අවශ්‍ය අවස්ථාවල දී විකල්ප බලශක්ති ප්‍රභවයන් හඳුන්වා දීම, සංවර්ධනය කිරීම හා ජාතික විදුලිබල පද්ධතිය හා සම්බන්ධ කිරීම.

(4) රාජ්‍ය ආයතන හා රජයේ ඉඩම්වල පිහිටි ප්‍රජා ශාලා සහ සමිති ශාලා සඳහා විදුලිය ලබාදීම.

15. පළාත් මාර්ග විෂය යටතේ යෝජනා හඳුනා ගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) සී හා ඩී වර්ගයට අයත් මාර්ග අලුතින් ඉදිකිරීම පවත්නා මාර්ග වැඩිදියුණු කිරීම හා මාර්ග නිසි ලෙස නඩත්තු කිරීම.

(2) මාර්ග සංවර්ධනයේ දී එහි තිරසර බව ආරක්ෂා කිරීමට මාර්ගය දෙපස කාණු පද්ධතිය සැකසීම බෝක්කු හා කුඩා පාලම් ප්‍රතිසංස්කරණය.

(3) පළාත් මාර්ග, කුඩා පාලම් ,බෝක්කු හා කාණු පද්ධති ඉදිකිරීම හා සංවර්ධනය.

(4) අදාළ ආයතනයන්හි නිර්දේශ මත අවශ්‍යතාවයට සරිලන පරිදි විධිමත් මාර්ග සංඥා සවිකිරීම.

16. නිවාස හා ඉදිකිරීම විෂය යටතේ යෝජනා හඳුනා ගැනීමේ දී හා අනුමත කිරීමේ දි පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) අඩු ආදායම් පවුල් සඳහා නිවසක ඉතිරි වැඩ හා අළුත්වැඩියා කටයුතු සඳහා ඉඩම් හිමිකම තහවුරු කර ගැනීමෙන් පසු එක් ප්‍රතිලාභී පවුලකට උපරිමය රුපියල් ලක්ෂයක් සහ අවමය රුපියල් තිස් දහසකට යටත් ව අනුග්‍රාහක මුදලක් හෝ ද්‍රව්‍යාධාර ලබාදිය හැකි ය.

සුවිශේෂි ආපදා අවස්ථාවක දී (නායයාම්, ගිනිගැනීම්, සුළිසුළං, ගංවතුර වැනි) උපරිමය රුපියල් ලක්ෂ තුනක මුදලක් ප්‍රාදේශීය ලේකම්ගේ විශේෂ නිර්දේශය යටතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු ය.

ඉහත හිමිකම් සඳහා සුදුසුකම් ලබන්නේ පහත සඳහන් කරුණක් හෝ සපුරාලන පවුල් පමණි. මෙම කරුණු ග්‍රාම නිලධාරිගේ සහතිකය මත තහවුරු කරගත යුතු ය.

(i) පාසැල් දරුවන්, ආබාධිත අය සිටින අඩු ආදායම්ලාභීන් වීම.

(ii) පවුලේ ආදායම උපයන්නා මිය යාම නිසා අසරණභාවයට පත්වීම.

(iii) ගෘහ මූලිකයා කාන්තාවක් වන අඩු ආදායම්ලාභී පවුලක් වීම.

17. සමාජ සුභසාධනය විෂය යටතේ යෝජනා හඳුනා ගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) රෝගී බව, මහළු බව, ආබාධිත බව හෝ අනාථභාවය නිසා සමාජීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුබසාධනය හා අධ්‍යාත්මික සංවර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(2) සමාජ සුබසාධනයට වැදගත් වන විධිමත් ලෙස රජයේ ලියාපදිංචි වූ සුබසාධන හා මරණාධාර සංවිධාන, වැඩිහිටි සමිති හා වැඩිහිටි බල මණ්ඩල සඳහා උපරිමය රුපියල් ලක්ෂයක් වන පරිදි අත්‍යාවශ්‍ය උපකරණ පමණක් ලබා දිය හැකි ය.

(i) එම උපකරණ පොදු සුබසාධන කටයුතු සඳහා භාවිතා කළ යුතු අතර, අදාළ ආයතනයේ භාණ්ඩ වට්ටෝරු ලේඛනයට ඒවා ඇතුළත් කළ යුතු ය.

(ii) ඉහත භාණ්ඩ ලබාදීමේ දී අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත, විධිමත් පරිදි භාණ්ඩ භාරදී ලේඛනගත කළ යුතු ය.

(3) වැඩිහිටි නිවාස හා ආබාධිත පුද්ගලයින් පුනරුත්ථාපනය කෙරෙන නිවාසවලට අවශ්‍ය උපකරණ ලබාදීම.

(4) වැඩිහිටියන් හා අවාසි සහගත ප්‍රජාව නිවාසගතවීම වැළැක්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා එවැනි වැඩිහිටි හා අවාසි සහගත ප්‍රජාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් සාමාන්‍ය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. වැඩිහිටි නිවාසවල සිටින නේවාසික වැඩිහිටියන් උදෙසා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

(5) ශ්‍රම බලකායට අයත්වන අවාසි සහගත ප්‍රජාව නිවාස ගතවීම වැළැක්වීම සඳහා ස්වයං රැකියා උපකරණ හා පුහුණු වැඩසටහන් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කළ හැකිය. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂක හෝ ඔහු/ඇය විසින් නම් කරනු ලබන ප්‍රාදේශීය නිලධාරියකුගේ නිර්දේශය සහිතව එම ප්‍රතිපාදන සැලසිය හැකි ය.

(6) බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ අවාසි සහගත ප්‍රජාවගේ රැකවරණය හා සුරක්ෂිතභාවය සැලසීම හා ඒ සම්බන්ධව දැනුවත් විය යුතු කාර්යමණ්ඩලවල ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(7) අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් ජීවත්වන නිවාසවල ඔවුන්ට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අදාළ පළාත් සමාජ සේවා නිලධාරී හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත උපරිමය රුපියල් ලක්ෂ දෙකක් දක්වා ප්‍රතිපාදන වෙන් කළ හැකි ය.

(8) අඩු ආදායම්ලාභී පවුල්වල විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් විශේෂයෙන් පාසල් යන වයසේ දරුවන්ට රුපියල් පනස් දහසකට යටත්ව ඔවුන්ගේ දෛනික ජීවිතය පහසු කරවන විශේෂිත උපකාරක උපකරණ ලබා දිය යුතුය. මෙම උපකරණ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විය යුතුය. මෙවැනි උපකරණ ලබාදීමේ දී ඒ සඳහා වෛද්‍ය නිර්දේශය සහ පළාත් සමාජ සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගතයුතුය.

18. නාගරික හා වතු යටිතල පහසුකම් විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) වතුවල ජීවත් වන ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා වතු මාර්ග වැඩි දියුණු කිරීම, ජල පහසුකම් ලබාදීම, විදුලි පහසුකම් ලබාදීම යටතේ පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් වලට අයත් නිවාස සඳහා විදුලි සම්බන්ධතාවය ලබාගැනීමට එක් ප්‍රතිලාභී පවුලකට රුපියල් විසි පන්දහසක උපරිමයකට යටත්ව අනුග්‍රාහක මුදලක් ලබාදිය හැකිය. ආදායම් තත්ත්වය පිළිබඳ ග්‍රාමනිළධාරීගේ සහතිකයක් ලබාගත යුතුය. නිවසකට විදුලිය ලබාගැනීම උදෙසා ලබාදෙන මෙම මුදල ගෙවිය යුත්තේ විදුලි බලය සපයනු ලබන ආයතනයටයි.

(2) වතුවල ජීවත් වන ජනතාවගේ නිවාස සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීම. මෙම අංශය යටතේ සෘජු ප්‍රදාන ලබා දීමට ප්‍රතිපාදන වෙන් කළ නොහැකි ය.

(3) නිසි ක්‍රමවේදයක් මගින් වතු මාර්ග නිශ්චිතව හඳුනා ගැනීම සිදු කළ යුතු ය. මෙහි දී වතු මැදින්, ගම්වලට ප්‍රවේශ වීම සඳහා තිබෙන මාර්ග පමණක් සංවර්ධනය කළ යුතු ය.

19. ප්‍රවාහන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් නඩත්තු වන බස් නැවතුම්පළ අංගන හැර අනෙකුත් ප්‍රධාන බස් අංගන ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය.

(2) පාර දෙපස මගී ආවරණ ඉදිකිරීම තුළින් පොදු ජනතාවට ගුණාත්මක සේවාවක් ලබා දීම.

(3) පළාත තුළ මගී ප්‍රවාහන බස් රථ තුළින් සිදුවන රිය අනතුරු අවම කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

20. ක්‍රීඩා විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) පළාතේ ජනතාව ක්‍රීඩා හා ශාරීරික සුවතා කටයුතුවලට යොමු කිරීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(2) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂගේ හා විෂයය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලැබූ ක්‍රීඩා නිලධාරියෙකුගේ නිර්දේශය මත, ලියාපදිංචි ක්‍රීඩා සමිති ප්‍රවර්ධනයට හා පෞද්ගලික නොවන කායවර්ධන මධ්‍යස්ථානයකට වසරකට උපරිමය රුපියල් ලක්ෂයකට යටත්ව ක්‍රීඩා උපකරණ ලබා දීම.

(3) පළාත් මට්ටමේ හෝ ජාතික මට්ටමේ ක්‍රීඩා තරග නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා වන ක්‍රීඩා උපකරණ හෝ ඇඟළුම් උපකරණ පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂගේ හෝ බලයලත් නිළධාරියෙකුගේ නිර්දේශය මත, එක් අයෙකුට වසර දෙකකට වරක් උපරිමය රුපියල් හැත්තෑ පන්දහසක්වන පරිදි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(4) පළාතේ පාසල් නොවන රජයේ අයිතිය තහවුරු වූ ක්‍රීඩා පිටිවල/ ක්‍රීඩා මධ්‍යස්ථානවල පහසුකම් සංවර්ධනය.

(5) පළාත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කුසලතාවයන් වර්ධනයට පුහුණු වැඩසටහන් සහ ක්‍රීඩා තරගාවලි පැවැත්වීම.

(6) ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් නිසි පරිදි සංවිධාන ගත කිරීම.

(7) ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුවිශේෂී හැකියාවන් දැක්වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීම සඳහා හා ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත් මට්ටමින් ඇගැයීමේ වැඩසටහන් පැවැත්වීම.

21. යෞවන කටයුතු විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) තරුණ ප්‍රජාවගේ වෘත්තීය හැකියාවන් වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(2) තරුණ ප්‍රජාව නවීන තාක්ෂණයට හුරු කරවීම සඳහා වැඩ සටහන් පැවැත්වීම.

(3) තරුණ ප්‍රජාව තුළ නායකත්ව, ආකල්ප හා පෞරුෂ සංවර්ධනය අරමුණු කරගනිමින් වැඩසටහන් පැවැත්වීම.

(4) වැඩසටහන් අනුමත කිරීමේ දී වර්ෂයේ මුල් කාර්තු දෙක තුළ සිදු කිරීම.

22. කාන්තා කටයුතු විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) ස්වයං රැකියාවක නිරත හෝ නිරත වීමට අපේක්ෂා කරන කාන්තාවන් සඳහා 30%ක ප්‍රතිලාභී දායකත්වය මත රුපියල් පනස් දහසක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන ලබාදීම.

(2) පීඩාවන්ට පත්වූ කාන්තාවන් හඳුනා ගැනීම හා ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘති යෝජනා කිරීම.

(3) ආර්ථික, සාමාජීය හා දේශපාලනික පරිසරයන් තුළ ප්‍රමුඛතාවය ලබා ගැනීම සඳහා පෞරුෂ සංවර්ධන, නායකත්ව වැඩමුළු පැවැත්වීම.

(4) කාන්තා උපදේශන වැඩසටහන් පැවැත්වීම.

23. සමුපකාර සංවර්ධන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) පාරිභෝගික ආකර්ෂණයට ලක්වන අයුරින් ව්‍යාපාරික ස්ථාන සංවර්ධනය හා ගුණාත්මක භාණ්ඩ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(2) සමුපකාර ක්ෂේත්‍රය තුළ නිරත නිළධාරීන්ගේ කුසලතාවන් ප්‍රවර්ධනයට සම්ප්‍රදායික පුහුණු හා වැඩසටහන්වලින් ඉවත් වී තරඟකාරීත්වයට ගැලපෙන පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම.

(3) සමුපකාර මූල්‍ය අංශවල මුදල් ග්‍රාමීය අංශවල අයෝජනය කිරීමට සුදුසු ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

(4) සමුපකාර විෂය දැනුම පාසල් ළමුන්ට ලබා දීම සඳහා පාසල් සමුපකාර සමිති ලියාපදිංචි කිරීමට වැඩසටහන් යෝජනා කිරීම.

24. ජල සම්පාදන හා ජලාපවාහන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) පානීය ජල පහසුකම් ලබා දීම සඳහා ප්‍රජාවට සුදුසු ජල පහසුකම් ලබාදීම.

(2) ප්‍රජා ජල ව්‍යාපෘති යටතේ ජල පහසුකම් සැපයීම.

(3) පානීය මෙන්ම අනෙකුත් අවශ්‍යතා සඳහා භාවිතාවන පොදු ළිං ඉදි කිරීම හා සංවර්ධනය කිරීම.

(4) අවශ්‍යතාවය අනුව සුදුසු ස්ථාන වෙත නල ළිං පහසුකම් ඇති කිරීම.

25. ධීවර විෂය යටතේ යෝජනා හඳුනා ගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(1) ග්‍රාමීය ජනතාවගේ පෝෂණ ඌණතාවයන් අවම කිරීම හා ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා මත්ස්‍ය නිෂ්පාදනය සුලභ කිරීමට, මිරිදිය හා සුළු පරිමාණ කරදිය ධීවර කර්මාන්තයේ නියුතුවන්නන්ට ධීවර ආම්පන්න හා උපකරණ වසර තුනකට වරක් ප්‍රතිලාභී දායකත්වය 30% ක් යටතේ උපරිමය රුපියල් ලක්ෂයක් දක්වා ලබාදීම.

(2) මත්ස්‍ය අලෙවිය ප්‍රවර්ධනයට ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

(3) අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීම හා කල්තබා ගැනීම සඳහා පහසුකම් ඇතිකිරීමට සැලසුම් කිරීම.

(4) විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(5) කිවුල්දිය හා කලපු ආශ්‍රිත ජලජීවී වගාව ව්‍යාප්ත කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(6) මත්ස්‍ය කර්මාන්තය ආශ්‍රිත අගය එකතුකල නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

(7) ධීවර ප්‍රජාව සඳහා පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පැවැත්වීම.

(8) ධීවර ප්‍රජාවගේ සමාජ සුභසාධනය සඳහා ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

(9) ධීවර කටයුතු සඳහා භාවිතා කරන අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධනය කිරීම.

26. ග්‍රාම සංවර්ධන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය:

(1) පළාත් පාලන විෂයට අයත් නොවන ගම් ආශ්‍රිතව නිශ්චිතව හඳුනාගත් කුඩා පාරවල්, ඒදඬු, කුඩා පාලම් හා බෝක්කු ග්‍රාමීය වෙළඳපොළ පහසුකම් යන අංශ ආශ්‍රිතව ව්‍යාපෘති ඉදිරිපත් කිරීම,

(2) පළාත් සභාවේ විධිමත් ලෙස ලියාපදිංචි වූ ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් බලය පවරනු ලැබූ ග්‍රාම සංවර්ධන නිලධාරියකුගේ නිර්දේශය මත වසර දෙකකට වඩා සක්‍රීයව පවත්වාගෙන යනු ලබන හා දැනට අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි පුටු හා එකලස් කළ හැකි ආවරණ නොමැති ග්‍රාම සංවර්ධන සමිති, සණස සමිති සඳහා රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව එම උපකරණ ලබා දීම,

(3) ග්‍රාමීය මට්ටමේ පිහිටුවා ඇති ස්වේච්ඡා සමිති ඒකරාශී කොට මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම තුළින් ප්‍රජා සංවර්ධනයට අවශ්‍ය ජාලයක් ගොඩනැගීම හා දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමට කටයුතු කිරීම,

(4) ග්‍රාම සංවර්ධන සමිති ශාලා වැනි පොදු ස්ථාන සඳහා ජලය හා විදුලිය ලබා දීම රුපියල් තිස් දහසක උපරිමයකට යටත්ව ලබාදිය හැකිය. ග්‍රාම සංවර්ධන සමිති නිලධාරීගේ නිර්දේශය සහිතව/අදාළ බිල්පත් ගෙවීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් සහිත ව තහවුරුවක් ලබාදිය යුතුය,

(5) ග්‍රාම සංවර්ධන විෂයය යටතේ ග්‍රාමීය මට්ටමේ තිබෙන පළාත් පාලන මාර්ග සඳහා මාර්ග අමාත්‍යාංශය මුදල් වෙන් කිරීමේදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ ක්‍රියාත්මක බලධාරියා විසින් පළාත් පාලන ආයතනයේ එකඟතාවය ලබාගත යුතුය.

27. සංචාරක ප්‍රවර්ධනය විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය:

(1) පළාත තුළ සංචාරක ආකර්ෂණීය ස්ථානයන්හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම,

(2) සංචාරක ආකර්ෂණීය ස්ථාන හා සංචාරක කර්මාන්තය ආශ්‍රිත ප්‍රචාරණ කටයුතු සිදු කිරීම,

(3) සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියා ප්‍රවර්ධනය කිරීම,

(4) සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිතව වඩාත් ගුණාත්මක සේවාවන් සැපයීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම,

(5) ජාත්‍යන්තර සංචාරක දිනය සැමරීමට සමගාමීව ක්‍රියාත්මක කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(6) සංචාරකයන් ඉලක්ක කර ගෙන නිෂ්පාදනය කරන භාණ්ඩවල ගුණාත්මක බව වැඩි කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා අලෙවි ප්‍රවර්ධනය,

(7) පාරිසරික සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

28. සත්ත්ව නිෂ්පාදන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය:

(1) මස්, කිරි හා බිත්තර ජනතාවට සැපයීම සඳහා නිරෝගිමත් සත්ත්ව ගහණයක් පවත්වාගෙන යාම;

(2) උසස් වර්ගයේ සතුන් බිහිකිරීමටත්, නිෂ්පාදනය වැඩිකිරීමටත් තාක්ෂණික ක්‍රම යොදාගැනීම හා ගොවීන් අතර ප්‍රචලිත කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම;

(3) සත්ත්ව පාලන ගොවීන්ගේ ආදායම් මට්ටම ඉහළ නංවාලීමට අවශ්‍ය වන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම;

(4) මෙම විෂය සම්බන්ධ යෙදවුම් හෝ සතුන් සෘජු ප්‍රදාන ලෙස ලබා දීමේ දී තාක්ෂණික කමිටුවක නිර්දේශය අනුව ප්‍රතිලාභී දායකත්වය 30% ක් යටතේ උපරිමය රුපියල් පනස් දහසක්ලෙස ලබාදීමට සැලසුම් කිරීම හා ඊට අමතරව පහත සඳහන් කරුණු යටතේ සෘජු ප්‍රදාන ලබාදීමේදී රජයේ උපරිම දායකත්වය පහත පරිදි ලබාදිය හැකිය:

(i) ගවයන් තුන්දෙනෙකුගේ ගව ගාලක් ඉදි කිරීමට 70%ක උපරිම දායකත්වය රුපියල් ලක්ෂයක් ද,

(ii) ගවයන් පස්දෙනෙකුගේ ගව ගාලක් ඉදි කිරීමට 70%ක උපරිම දායකත්වය රුපියල් එක් ලක්ෂ පනස් දහසක් ද,

(iii) කිරිදෙනෙකු, මීදෙනෙකු මිලදී ගැනීමේදී 70%ක දායකත්වය රුපියල් ලක්ෂයක් ද, වන පරිදි උපරිම දායකත්වය ලබාදිය හැකිය;

(5) අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම;

(6) පරිසර දූෂණය අවම වනසේ සත්ත්ව ගොවිපල පවත්වාගෙන යාම හා අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමවේද සැලසුම් කිරීම යටතේ ඍජු ප්‍රදාන ලෙස ප්‍රතිලාභී දායකත්වය 30% මත ඝන මීටර අටක ජීව වායු ඒකකයක් සඳහා 70% ක රජයේ දායකත්වය මත රුපියල් එක් ලක්ෂ හතලිස් දහසක උපරිමයක් ලබාදිය හැකිය;

(7) කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන හා ගබඩා පහසුකම් ඇතිකිරීම සඳහා සැලසුම් සකස් කිරීම;

(8) සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ නියුතු ගොවීන් හා නිලධාරීන් සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම;

(9) කුඩා හා මධ්‍ය පරිමාණයේ පෞද්ගලික සත්ත්ව ගොවිපලවල් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(10) සත්ත්ව නිෂ්පාදන කටයුතු හා සම්බන්ධ ගොඩනැගිලි ඉදිකිරීම සංවර්ධනය හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම.

09 - 206

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.